**සංක්‍රමණ වීසා**

එක්සත් ජනපදයට සංචාරය කිරීමට අවශ්‍ය ශ්‍රී ලංකාවේ හා මාලදිවයින් පුරවැසියන්ගේ වීසා අයදුම්පත් පිළිබඳ ව කටයුතු කරනු ලබන්නේ කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලයයි.

සංක්‍රමණ වීසාවක් අයැදුම් කිරීමට බලාපොරොත්තු වන විදේශීය පුරවැසියෙකුට සාමාන්‍යයෙන් එක්සත් ජනපද පුරවැසියෙක් හෝ නීත්‍යානුකූල ස්ථිර නේවාසික ළඟ ම ඥාතියෙක් හෝ අපේක්ෂිත එක්සත් ජනපද සේවාදායෝජකයෙක් විසින් අනුග්‍රහය දැක්විය යුතු අතර සංක්‍රමණ වීසාවකට අයැදුම් කිරීමට පෙර අනුමත පෙත්සමක් තිබිය යුතුය. අනුග්‍රාහකයා විදේශීය පුරවැසියා වෙනුවෙන් එක්සත් ජනපද පුරවැසි හා සංක්‍රමණ සේවයේ (USCIS) පෙත්සමක් ගොනු කිරීමෙන් මෙම ක්‍රියාවලිය ආරම්භ කරයි. අපේ විවිධත්ව වීසා වැඩසටහන ඇතුළු එක්සත් ජනපදයේ විවිධ සංක්‍රමණ වීසා වර්ග ගැන දැන ගැනීමට usvisas.state.gov නම් වෙබ් අඩවියේ Directory of Visa Categories සමාලෝචනය කරන්න. ඉන්පසු සංක්‍රමණ වීසාවක් සඳහා අයැදුම් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට usvisas.state.gov වෙබ් අඩවියේ සංක්‍රමණ වීසා ක්‍රියාවලිය (Immigrant Visa Process) හෝ විවිධත්ව වීසා ක්‍රියාවලිය (Diversity Visa Process) යටතේ ඇති පියවර අනුගමනය කරන්න.

එක්සත් ජනපද පුරවැසි හා සංක්‍රමණ සේවය (USCIS) ඔබේ පෙත්සම අනුමත කිරීමෙන් පසුව හා ජාතික වීසා මධ්‍යස්ථානය (NVC) සමග පෙර-සැකසුම් සම්පූර්ණ කිරීමෙන් හෝ විවිධත්ව වීසා ලොතරැයියෙන් ඔබ තේරී ඇත්නම් කෙන්ටකි කොන්සියුලර් මධ්‍යස්ථානය (KCC) සැකසුම් කටයුතු සම්පූර්ණ කිරීමෙන් පසුව වැඩිදුර කටයුතු කිරීමට මෙම වෙබ් අඩවියේ දී ඇති තොරතුරු සමග ජාතික වීසා මධ්‍යස්ථානයෙන් හෝ (NVC) කෙන්ටකි කොන්සියුලර් මධ්‍යස්ථානයෙන් (KCC) දී ඇති උපදෙස් අනුගමනය කරන්න.